(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 103.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 නොවැම්බර් 08 සඳුදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1913/2021

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඔවුන්ට එරෙහිව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් ඇතිවීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2198/2021

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා අභ්‍යන්තර කටයුතු. වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1624/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම වර්ෂයකම මහ කන්නයේ වර්ෂාවත් සමඟ මල්වතු ඔය පිටාර ගැලීමෙන් අනුරාධපුර නගරයට ගංවතුර තර්ජනයක් ඇති වන බවත්;

(ii) එම ගංවතුර තර්ජනය අවම කිරීම සඳහා පසුගිය රජය විසින් මල්වතු ඔය සංවර්ධන ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය නතර කර තිබේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ගංවතුර හේතුවෙන් පීඩාවට පත්වන මල්වතු ඔය අවට සහ අනුරාධපුර නගරය අසල පදිංචි ජනතාව ඉන් මුදාගැනීම සඳහා නව වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

785/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2018 සිට 2020 දක්වා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලින් අදාළ පාඨමාලා සාර්ථකව නිම කළ සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන විද්‍යා පීඨය සහ විෂයය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පිරිස අතරින් මේ වනවිට ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගනු ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) සෙසු පිරිස ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1649/2021

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 සහ 2020 යන වර්ෂවල කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සඳහා—

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත තීරණය වූ කඩඉම් ලකුණු;

(ii) ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු මත 6 වන ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සංඛ්‍යාව;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද මුළු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සංඛ්‍යාවෙන් ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත තීරණය වූ කඩඉම් ලකුණු මත ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සංඛ්‍යාව;

(iv) 5 සහ 6 ශ්‍රේණියේ පැවති සමාන්තර පන්ති සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

469/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයට අදාළව පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල, එම වර්ෂයේ සමස්ත අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස;

(iii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේ ලියාපදිංචි කරන ලද නවෝත්පාදන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමේදී අනුගමනය කල යුතු ක්‍රමවේදය කවරේද;

(ii) නවෝත්පාදන සිදුකරනු ලබන පර්යේෂකයන් මුහුණ දෙනු ලබන මූල්‍ය දුෂ්කරතා අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

439/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් වන දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ හා වෙනත් ආයතනයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානයේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ආයතන අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන ආයතනවල නම් කවරේද;

(v) එම ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉහත අමාත්‍යාංශයට අයත් වන සියලු ආයතන රජයේ ගොඩනැගිලි තුළ ස්ථාපනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1929/2021

ගරු එච්. නන්දසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි දූෂණ ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1721/2021

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව;

(ii) ඒ වෙනුවෙන් වැය කරන ලද මුදල;

(iii) ඉදිකිරීම් අවසන් කරන ලද හා නොකරන ලද නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිකිරීම් අවසන් කරන ලද සහ ඉදිකිරීම් අවසන් නොකරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිවාස ඉදිකිරීමේදී ලබා දුන් මුදල, ලබා දෙන ලද්දේ ණය මුදලක් වශයෙන්ද නොඑසේ නම්, ආධාර මුදලක් වශයෙන්ද;

(ii) ණය මුදලක් නම්, ණය වාරික එකතු කිරීම ආරම්භ කර තිබේද;

(iii) ණය වාරික ගෙවීම පැහැර හැර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ණය වාරික ගෙවීම පැහැර හැර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1087/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉතා සංවේදී පාරිසරික පද්ධතියක් වන වත්තල වගුරුබිම් ප්‍රදේශයට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කැලි කසළ බැහැර කරනු ලබන බවත්;

(ii) මේ හේතුවෙන් එම පරිසර පද්ධතියේ ශාක හා සත්ත්ව විශේෂවලට දැඩි අහිතකර බලපෑමක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) වත්තල වගුරුබිම් ප්‍රදේශයට කැලි කසළ බැහැර කිරීම වැළැක්වීම සඳහා සහ එම පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1863/2021

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැවිලි මානව සංවර්ධන භාරය විසින් වතු කම්කරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ඉටුකරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) එම ආයතනය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාර්යාල පිහිටුවා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iv) එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් ක්‍රියාත්මක කරන ලද එක් එක් ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා එක් එක් ප්‍රාදේශීය කාර්යාලය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය කාර්යාලක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාවට සාපේක්ෂව සාධාරණව බෙදී ගොස් ඇති බව සහතික කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1278/2020

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජය විසින් විදේශ තානාපති සේවයට හෝ රාජ්‍ය තාන්ත්‍රික සේවයට පත් කරන ලද තානාපතිවරුන්ගේ හෝ මහ කොමසාරිස්වරුන්ගේ නම් ඔවුන් පත් කරන ලද එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සඳහන් තානාපතිවරුන් හෝ මහ කොමසාරිස්වරුන් පත් කිරීමේදී එසේ පත් කරනු ලබන නිලධාරින්ගේ විදේශ සේවයේ අත්දැකීම් හා පළපුරුද්ද සලකා බලා තිබේද;

(iii) ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය ඉහත සඳහන් තානාපතිවරුන්ට හෝ මහ කොමසාරිස්වරුන්ට නිශ්චිතව පවරා දී තිබේද;

(iv) ඔවුන් එම කාර්ය භාරය ඉටු කරනු ලබන බවට පසුවිපරමක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1395/2021

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1977 වර්ෂය වනවිට ලංකා ධීවර සංස්ථාව සතු සියලුම ශීතාගාරවල මත්ස්‍ය ගබඩා ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) අක්‍රිය වී තිබූ ලංකා ධීවර සංස්ථා ශීතාගාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය රජය විසින් වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබේද;

(iv) මේ වනවිට ලංකා ධීවර සංස්ථාවේ සියලුම ශීතාගාරවල මත්ස්‍ය ගබඩා ධාරිතාවය කිලෝ ග්‍රෑම් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1671/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන ධීවර වරාය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරායවල නම් කවරේද;

(iii) එම ධීවර වරාය අතරින් මේ වනවිට වැලි ගොඩගැසී ඇති ධීවර වරාය සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර වරායවල නම් කවරේද;

(v) එම ධීවර වරායවල ගොඩගැසී ඇති වැලි ඉවත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2278/2021

ගරු කුමාරසිරි රත්නායක මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

16.

894/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් "එක්ස්පෝර්ට්ස් 2000" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එම වැඩසටහන ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම වැඩසටහන යටතේ මේ වනවිට හඳුනාගෙන ඇති අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අපනයනකරුවන් අතර සිටින කාන්තා ව්‍යවසායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

17.

673/2020

ගරු හේෂා විතානගේ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරුවන් ලෙස කටයුතු කළ එක් එක් පුද්ගලයාගේ නම සහ ඔහු සේවය කරන ලද කාල සීමාව කවරේද;

(ii) එම එක් එක් පුහුණුකරුවාට ගෙවන ලද වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(iii) එම එක් එක් පුහුණුකරුවා යටතේ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම ලැබූ ටෙස්ට් හා එක්දින ජාත්‍යන්තර තරග ජය හා පරාජයන් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම සඳහා පුහුණුකරුවකු තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

18.

1690/2021

ගරු කුමාර වෙල්ගම මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට පවතින ක්‍රිකට් ක්‍රීඩා සමාජ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2020 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වාර්ෂිකව ලබා දෙන ලද ආධාර මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාසල් ක්‍රිකට් ක්‍රීඩාව සහ සෙසු පාසල් ක්‍රීඩා දියුණු කිරීමේ වැඩපිළිවෙලක් සකස් කර තිබේද;

(ii) එම වැඩපිළිවෙළ කළුතර දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන පාසල්වල නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

19.

674/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන කවරේද;

(ii) වර්ෂ 2010 සිට එම එක් එක් පළාත් පාලන ආයතනය සඳහා සබරගමුව පළාත් සභාවෙන් අය විය යුතු මුද්දර ගාස්තුවල වටිනාකම කොපමණද;

(iii) එම මුද්දර ගාස්තුවල වටිනාකම අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

20.

907/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර, තලාව නගරයේ බස් නැවතුම්පළෙහි ගොඩනැගිලි ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) වැසි දිනවලදී එම බස් නැවතුම්පළ මගී ජනතාවට භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම බස් නැවතුම්පළ අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

21.

978/2020

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය නගර සභාවේ සේවය කරනු ලබන සේවකයන්ගේ භාවිතය වෙනුවෙන් නාවලපිටිය නගර සීමාවේ "සොයිසාකැලේ" ප්‍රදේශයේ බද්ධ නිවාස සංකීර්ණයක් පවතින බව දන්නේද;

(ii) එම බද්ධ නිවාස ව්‍යාපෘතිය ආරම්භයේදී එහි ඉදිකරනු ලැබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පදිංචි කරවනු ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම නිවාස සංකීර්ණයේ ලියාපදිංචි අංක සහ විදුලිය පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) එම නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බද්ධ නිවාස සංකීර්ණය වෙනුවට නව නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා පසුගිය කාලයේදී සැලසුම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

22.

2271/2021

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් පළාත් පාලන ආයතනයේ—

(i) අනුමත මුළු කම්කරු තනතුරු සංඛ්‍යාව;

(ii) අනුමත සෞඛ්‍ය කම්කරු තනතුරු සංඛ්‍යාව;

(iii) මේ වනවිට සේවය කරනු ලබන මුළු කම්කරුවන් සංඛ්‍යාව;

(iv) මේ වනවිට සේවය කරනු ලබන සෞඛ්‍ය කම්කරුවන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කම්කරු තනතුරුවල පුරප්පාඩු හෝ අතිරික්තයක් පවතින්නේද;

(ii) එම පුරප්පාඩු හෝ අතිරික්තය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

23.

3007/2021

ගරු එම්. එස්. තවුෆික් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1995.07.01 දින සිට විවිධ අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2011 අනුව විශ්‍රාම වැටුප් හිමිකම් ලබන තනතුරුවල) වසර පහළොවකට අධික කාලයක් සේවය කරන ලද, එම්. නයිමුල්ලාහ් මහතා (විශ්‍රාම වැටුප් අංක 01-802666) විසින් අවසන් වරට ලබා ගන්නා ලද මූලික වැටුප කොපමණද;

(ii) නයිමුල්ලාහ් මහතා විසින් අවසන් වරට ලබා ගන්නා ලද මූලික වැටුප පදනම් කොටගෙන ඔහුගේ විශ්‍රාම වැටුප සැකසීම මේ වනතෙක් සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) එවකට නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක 01/10/04/05 (1) හා 2019/07/08 දිනැතිව, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් අමතන ලද ලිපිය ප්‍රකාරව නයිමුල්ලාහ් මහතාගේ විශ්‍රාම වැටුප් නිසි පරිදි ගණනය කර ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

24.

945/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(ii) එම අරමුදල පාලනය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iii) එම අරමුදල පාලනය කිරීම සඳහා රජයේ නිලධාරියකු පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට ඉහත සඳහන් අරමුදලෙන් ලබා දී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඒ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

25.

825/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලන්ගමුව ප්‍රදේශයේ, වකුගඩු රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා රෝහලක් ඉදිකර ඇති බවත්;

(ii) ගල්ගමුව හා පොල්පිතිගම ප්‍රදේශවල ජීවත්වන විශාල පිරිසක් වකුගඩු රෝගයට ගොදුරු වී ඇති බවත්;

(iii) එහෙත්, ඉහත සඳහන් රෝහල වසර 03කට අධික කාලයක් තිස්සේ වසා දමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත සඳහන් රෝහල කඩිනමින් විවෘත කර වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

26.

994/2020

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම මූලික රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලය හා එම රෝහලේ මේ වනවිට සිටින කාර්ය මණ්ඩලය එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහලට අවශ්‍ය මානව සම්පත ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

27.

1080/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 05ක කාලය තුළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ මියගිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) වකුගඩු රෝගය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය විසින් ක්‍රියාත්මක කරන ලද, වකුගඩු රෝගීන් සඳහා මාසිකව අධාර මුදල් ලබා දීමේ වැඩසටහනට අලුතින් හඳුනාගනු ලැබූ වකුගඩු රෝගීන් ඇතුළත් කර නොමැති බවත්;

(ii) අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (i) සහ (ii) හි සඳහන් වැඩසටහන් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

28.

1200/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර මහ රෝහලේ —

(i) අධ්‍යක්ෂවරයා පත් කරන ලද පදනම කවරේද;

(ii) මේ වනවිට සේවය කරනු ලබන වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) වෛද්‍ය නිලධාරි තනතුරෙහි මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට සේවය කරනු ලබන හෙද කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනවිට පවතින හෙද පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ අනුරාධපුර මහ රෝහලේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ හෘද රෝග ශල්‍යාගාරයේ;

(ii) ළමා හා මාතෘ සායන සඳහා වන ගොඩනැගිලි සංකීර්ණයේ;

(iii) අංග සම්පූර්ණ හදිසි ප්‍රතිකාර ඒකකයේ;

වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

29.

2267/2021

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෝහල් වර්ගීකරණය අනුව කඩුගන්නාව රජයේ රෝහල අයත් වන වර්ගය කවරේද;

(ii) එම රෝහලේ මෘත ශරීරාගාරයක් තිබේද;

(iii) එම රෝහලේ සේවය කරනු ලබන සාමාන්‍ය වෛද්‍යවරු හා විශේෂඥ වෛද්‍යවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රෝහල සංවර්ධනය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පේරාදෙණිය ශික්ෂණ රෝහලෙන් විශාල ජනතාවක් සේවා ලබා ගන්නා බව පිළිගන්නේද;

(ii) පේරාදෙණිය රෝහලෙන් සේවා ලබා ගැනීම සඳහා පවතින අධික ඉල්ලුම අවම කිරීමේ පියවරක් ලෙස කඩුගන්නාව රජයේ රෝහල, මූලික රෝහලක් බවට පත් කිරීමට සැලසුම් කරන්නේද;

(iii) එසේ නම්, ඊට අදාළ සැලසුම් කවරේද;

(iv) කොටලිගොඩ, ඉලුක්තැන්න හා දොඩම්වල ග්‍රාමීය රෝහල් නවීකරණය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

30.

2976/2021

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල්වල නම් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

31.

2178/2021

ගරු ගාමිණී වලේබොඩ මහතා,—ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

32.

295/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ විනිමය ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

33.

842/2020

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල හා දිනය;

(iv) ඒ මඟින් උත්පාදනය වන රැකියා සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කර්මාන්තශාලාව සම්බන්ධයෙන් වංචා හා දූෂණ සිදු වන බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

34.

615/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ පැවති මහ මැතිවරණයට පෙර බඳවා ගනු ලැබූ ව්‍යාපෘති සහායකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම ව්‍යාපෘති සහායකයන් අනුයුක්ත කරන ලද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවල නම් කවරේද;

(iv) එම ව්‍යාපෘති සහායකයන්ගේ සේවය මේ වනවිට අවසන් කර තිබේද;

(v) ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

35.

1827/2021

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන සුරාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සුරාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සුරාසල් අතරින් වැඩි ප්‍රමාණයක් වතුකරය තුළ හෝ ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන බව දන්නේද;

(iv) එසේ නම්, එසේ පවත්වාගෙන යනු ලබන සුරාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන සුරාසල් අතරින් බොහෝ ප්‍රමාණයක් ආගමික ස්ථානවලට හෝ පාසල්වලට නුදුරුව පවත්වා ගෙන යනු ලබන බව දන්නේද;

(ii) වතුකරය ආශ්‍රිතව ජීවත්වන ජනතාවට හිරිහැරවන ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන සුරාසල් ඉවත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

36.

1909/2021

ගරු ජගත් පුෂ්පකුමාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

37.

1919/2021

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

38.

1406/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ දූපත් ප්‍රදේශවල ඉල්මනයිට් කැණීම සඳහා පර්යේෂණ කිරීමට හැමර්ස්මිත් ලංකා, ඔරියන්ට් මිනරල්ස්, සනුර් මිනරල්ස්, හිල් සයිට් එක්ස්ප්ලොරේෂන්, සුප්‍රීම් සොලූෂන්ස් සහ සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම වැනි ආයතනවලට අවසර ලබා දී තිබෙන බවත්;

(ii) ටයිටැනික් සැන්ඩ්ස් ලිමිටඩ් නැමැති ඕස්ට්‍රේලියානු සමාගම විසින් මන්නාරම් දූපතේ ඉල්මනයිට් කැණීම සඳහා බලපත්‍ර ලබා ඇති බවට සහ කඩිනමින් කැණීම් කටයුතු ආරම්භ කිරීමට නියමිත බවට නිල වශයෙන් දන්වා ඇති බවත්;

(iii) පර්යේෂණ කටයුතු සඳහා මන්නාරම් දූපතේ පේසාලේ ගම්මානයේ වැලි කන්ටේනර් 20 ක් දකුණු අප්‍රිකාවට යවන ලද බවත්;

(iv) මන්නාරම් දූපතේ බිම් මට්ටම සහ මුහුදු මට්ටම සාමාන්‍යයෙන් එක සමානව පවතින බැවින් වැලි කැණීම් කටයුතු සිදු කිරීමෙන් අනාගතයේදී එම දූපත විනාශ වීමේ තත්ත්වයක් උදාවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මන්නාරම් දූපතේ වැලි කැණීම් කටයුතු වැළැක්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

39.

779/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සූඩුවෙන්දපුලබු ගම්මානයට සමීපව ඇති රාසේන්ද්‍රකුලම් ගම්මානයේ පිහිටා ඇති රජයේ ඉඩම් 1970 වර්ෂයේ සිට එම ප්‍රදේශයේ ජනතාව විසින් හේන් වගාව සහ සත්ව පාලන කටයුතු සඳහා භාවිතා කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක 2013/01 දරන චක්‍රලේඛය අනුව, ඉහත ජනතාව අතරින් ඉඩම් කච්චේරි මඟින් බලපත්‍ර ලැබීමට සුදුස්සන් ලෙස තෝරාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍ර ලැබී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) තෝරාගත් සියලු දෙනාට බලපත්‍ර ලබා දීමට මේ වනවිට පවතින බාධාවන් කවරේද;

(v) එම බාධාවන් ඉවත් කර, තෝරාගත් සියලු දෙනාටම බලපත්‍ර ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

40.

1796/2021

ගරු රෝහණ දිසානායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා වූ කාලය තුළ මාතලේ, ඇල්කඩුව පිහිටි හගරන්කන්දවත්ත නැමැති ඉඩමෙන් අක්කර 105ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පෞද්ගලික පාර්ශ්වයකට බදු දී තිබේද;

(ii) එම ඉඩමේ පවතින කොස් සහ ගිනි සපු ආදී ගස් කපා එම ගස් විකුණා ගැනීමට ඉහත බදුකරුට අවසර දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට කපා විකුණා ඇති ගස් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගස්වල මූල්‍යමය වටිනාකම කොපමණද;

(v) ඉහත ඉඩම විධිමත් පරිදි බදු දී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(vi) ඒ සම්බන්ධයෙන් පියවරක් නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

41.

569/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නැව්වලින් ගෙන එනු ලබන බනිජ තෙල් ගොඩබෑමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් වර්ෂ 2015 සිට 2020 දක්වා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම නැව් සමාගම්වලට ගෙවන ලද ප්‍රමාද ගාස්තු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාද ගාස්තු ගෙවීමට හේතු වූ කරුණු කවරේද;

(iii) ශ්‍රී ලංකාවට නැව්වලින් ගෙන එනු ලබන බනිජ තෙල් ගොඩබෑමේදී සිදුවන ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

42.

2274/2021

ගරු ඩී. වීරසිංහ මහතා,—බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා බනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

43.

2517/2021

ගරු වීරසුමන වීරසිංහ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තේ අපනයනය කිරීම මඟින් ශ්‍රී ලංකාව ලබන ආදායම, ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) පසුගිය දශක දෙකක කාලය තුළ එම ආදායමේ අඩුවීම කොපමණද;

(iii) තේ අපනයනය කිරීම මඟින් 2021 වර්ෂයේ ලබා ගැනීමට අපේක්ෂිත ආදායම කොපමණද;

(iv) 2020 වර්ෂයට සාපේක්ෂව එම ආදායම වර්ධනය වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) චීනය හා කෙන්යාව වැනි රටවල් විසින් අන්තර්ජාතික තේ වෙළඳපළ ආක්‍රමණය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට අහිමිවන අන්තර්ජාතික තේ වෙළඳපළ කොටස ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) "සිලෝන් ටී" නාමය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ තේ සඳහා නව අන්තර්ජාතික වෙළඳපල සොයා ගැනීමට හා පවතින වෙළඳපළ පුළුල් කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

44.

1105/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොල් වගාව සීඝ්‍රයෙන් පිරිහෙමින් පවතින බව එතුමා පිළිගන්නේද?

(ආ) පොල් වගාව වැඩිදියුණු කිරීම සඳහා—

(i) නව ඉඩම්වල පොල් වගාකිරීම සඳහා පොල් වගාකරුවන්ට සහනාධාරයක් ලබා දීමට;

(ii) පවතින පොල් වගාව අතර පොල් ලෙලි වැළලීම, කාණු අගල් ඉදිකිරීම සඳහා සහනාධාර ලබා දීමට;

(iii) පොල් පොහොර නොමිලේ ලබා දීමට;

(iv) නව ඉඩම්වල පොල් වගා කරවීමට කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

45.

324/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික ජීවන විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති ජීවන විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික ජීවන විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික ජීවන පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික මීවන ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

46.

1631/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිය යනු යම් රටක ජීවත්වන ප්‍රජාවන්, විධිමත් හැසිරීම් සහ ක්‍රියාකාරකම් සහිත පිරිසක් ලෙස පාලනය කිරීම මඟින් සමාජයේ යහපැවැත්ම උදෙසා අනුගමනය කරනු ලබන ව්‍යවස්ථාපිත රීති පද්ධතියක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) එම උසාවි පිහිටුවීමේ මූලික අරමුණ කවරේද;

(iii) මේ වනවිට එම අරමුණ ඉටු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාති උසාවි සඳහා විනිසුරුවරුන් පත්කිරීමේ ක්‍රමවේදය කවරේද;

(ii) මේ වනවිට කාති උසාවි සඳහා පත්කර ඇති විනිසුරුවරුන් ඉහත සඳහන් ක්‍රමවේදය අනුව පත් කර තිබේද;

(iii) කාති උසාවියක් පවත්වාගෙන යාම සඳහා එහි විනිසුරුවරයා සහ ගොඩනැගිලි වෙනුවෙන් වෙන් කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

47.

2534/2021

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සංඛ්‍යාව හා සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2010 සිට 2020 දක්වා පාරිතෝෂිත මුදල් ගෙවීමට ඇති සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම හිඟ පාරිතෝෂිත මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

48.

1402/2020

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඔක්කම්පිටිය පොලිස් ස්ථානය මේ වනවිට පවත්වාගෙන යනු ලබන්නේ සී/ස බුත්තල (විවිධ) සේවා සමූපකාර සමිතියට අයත් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක වන බවත්;

(ii) 2021.02.19 දිනෙන් අවසන් වන ඊට අදාළ කුලී ගිවිසුම නැවත දීර්ඝ නොකිරීමට සීමාසහිත බුත්තල (විවිධ) සේවා සමූපකාර සමිතිය තීරණය කර ඇති බවත්;

(iii) පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා ඔක්කම්පිටිය නගරය තුළ වෙන් කරන ලද ඉඩම මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔක්කම්පිටිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති ඉඩමෙහි එම පොලිස් ස්ථානය ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, එම පොලිස් ස්ථානය පවත්වාගෙන යෑමට අපේක්ෂිත විකල්ප ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

49.

946/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වේලනයිතුරෙයි සිට පුංගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා වන පාලම ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දිගම පාලම්වලින් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ දිග කොපමණද;

(ii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පාලම මතින් ගමන් කිරීම දැඩි අවදානම් සහගත බවත්;

(ii) සාමාන්‍ය ජනතාව සහ වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන මෙම පාලම මතදී බොහෝ අනතුරු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම අනතුරු සිදු වීමට බලපාන හේතු කවරේද;

(ii) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

50.

2599/2021

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා මහාමාර්ග විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

වෙළඳ අමාත්‍යතුමා,— මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන),— 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු, 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 2247/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කම්කරු අමාත්‍යතුමා,— ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ නියෝගය,— 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20අ වගන්තිය සමඟ කියවිය යුතු 31 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021.10.04 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)(ඊ) වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 සැප්තැම්බර් 08 දිනැති අංක 2244/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 09 දිනැති අංක 2222/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංචාරක අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2)(ඩ) වගන්තිය යටතේ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 සැප්තැම්බර් 08 දිනැති අංක 2192/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ණඅ) සහ (ණආ) වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුනි 03 දිනැති අංක 2126/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 12 දිනැති අංක 2218/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අධිකරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මැයි 03 දිනැති අංක 2226/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*17.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඈ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

19.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---